# 1.5 මූලද්‍රව්‍ය ආවර්තිතා වගුවේ දරන ස්ථානය තහවුරු කිරීමට හා ඒවායේ පරමාණුක ගුණ ඉලෙක්ට්‍රෝන වින්‍යාසයට සම්බන්ධ කිරීම සඳහා මූලද්‍රව්‍යවල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය විශ්ලේෂණය කිරීම.

- ඉලෙක්ට්‍රෝන වින්‍යාසය පදනම් කොට ආවර්තිතා වගුව ගොඩනැගීම.
- ඉලෙක්ට්‍රෝන වින්‍යාසය අනුව මූලද්‍රව්‍ය s, p හා d ගොනු යටතේ වර්ග කිරීම.
- ඉලෙක්ට්‍රෝන වින්‍යාසය අනුව 1 සිට 18 කාණ්ඩවලට හා 1 සිට 7 දක්වා ආවර්තවලට අයත් මූලද්‍රව්‍ය හඳුනා ගැනීම.
- නිවාරක ආවරණය සහ සඵල න්‍යෂ්ටික ආරෝපණය විස්තර කිරීම.
- සහසංයුජ අරය, වැන්ඩවාල් අරය සහ ලෝහක අරය යොදා ගනිමින් පරමාණුවක අරය විස්තර කිරීම.
- කැටායනයක සහ ඇනායනයක අරය එහි පරමාණුක අරය සමග සන්සන්දනය කිරීම.
- s හා p ගොනුවල මූලද්‍රව්‍ය ආවර්තයක් දිගේ හරහට හා කාණ්ඩයක් දිගේ පහළට පෙන්නුම් කරන නැඹුරුතා විස්තර කිරීම. (පරමාණුක අරය, විද්‍යුත්-සෘණතාව, ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය වෙනස (E,eg), ප්‍රථම අයනීකරණ ශක්තිය, කැටායන හා ඇනායන සෑදීමේ නැඹුරුතාව)
- මූලද්‍රව්‍යවල ඉලෙක්ට්‍රෝන වින්‍යාස පදනම් කර ගනිමින් පළමු අයනීකරණ ශක්තියේ අක්-වක් විචලනය පැහැදිලි කිරීම.
- ඉලෙක්ට්‍රෝන බන්ධුතා ශක්තිය සඳහන් කිරීම.
- ආවර්තයක් දිගේ හරහට සහ කාණ්ඩයක් දිගේ පහලට ඉලෙක්ට්‍රෝන බන්ධුතා ශක්තිය විචලනය වන අයුරු විස්තර කිරීම.
- පෝලිං පරිමාණය අනුව මූලද්‍රව්‍යයක විද්‍යුත් සෘණතාව විස්තර කිරීම.